آ
# ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
# அனர்த்த முகாமைத்துவ அமைச்சு
# Ministry of Disaster Management
# ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
# தேசிய அனர்த்த நிவாரண சேவைகள் நிலையம்
# National Disaster Relief Services Centre


විද්‍යා මාවත,
කොළඹ 7.

வித்யா மாவத்தை,
கொழும்பு 7.

Vidya Mawatha
Colombo 7


මගේ අංකය : NDRSC/Trans.DO.DA/2013 දිනය : 2013.12. 02

**අභ්‍යන්තර චක්‍රලේඛ 1-2013**

සියලුම දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම්වරුන් මගින්

දිස්ත්‍රික් සංවර්ධන සහකාර/ නිලධාරී ( ආපදා කළමනාකරණ)

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සංවර්ධන නිලධාරී (ආපදා සහන සේවා)

<u>ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර ස්ථාන මාරු කිරීමේ ප්‍රතිපත්තිය</u>

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් බඳවා ගන්නා ලද සංවර්ධන සහකාර නිලධාරීන් සහ ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයට , දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන්ගේ අභ්‍යන්තර ස්ථාන මාරු කිරීමේ ප්‍රතිපත්තිය පහත සඳහන් පරිදි වේ. ඒ අනුව 2014.01.01 දින සිට එම ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවනු ලැබේ.

ආපදා සහන සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත වන සෑම නිලධාරියෙක්ට ම ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්යය පටිපාටික රීති ( කාණ්ඩ අංක I) හි XVII අදාළ ප්‍රතිපාදනයන්ට අනුකූලව හැකි සෑම විටකම උපරිම සාධාරණත්වය තුළ සේවා ස්ථාන ලබා දීම සඳහාත් විශේෂයෙන් ම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ දැක්ම, මෙහෙවර හා අභිමතාර්ථ ඉටුවන ආකාරයට හා ජනතාවට කාර්යක්ෂම සහ සඵලදායී සේවාවක් වඩාත් විනිවිද භාවයකින් යුක්තව සිදුකිරීම සඳහාත් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවනු ලැබේ.

01. සේවා ස්ථාන වර්ගීකරණය

    රටෙහි පැවති ආපදා තත්ත්වයන් සහ ඉදිරියේ දී ඇතිවිය හැකි ආපදා තත්ත්වයන් සළකා බලා ඒ ඒ දිස්ත්‍රික්කවල ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයන් ආපදා අවදානම් සහිත ප්‍රදේශ සහ ආපදා අවදානම් අවම ප්‍රදේශ ලෙස වර්ගීකරණය කරනු ලැබේ. (ඇමුණුම 01)

02. අභ්‍යන්තර ස්ථාන මාරුවකදී සළකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති

    I. අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබන්නේ ස්ථාන මාරු වීම් කරන වර්ෂයට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වෙනි දිනයට.(උදාහරණ : 2014 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2013.12.31 දින)

II. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සේවය කරන සංවර්ධන නිලධාරී ( ආපදා සහන සේවා ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට අනුයුක්ත කිරීමට අයදුම් කරන අවස්ථාවකදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන ලද කාලයේදී ඔහුගේ /ඇයගේ කාර්යක්ෂමතාවය පිළිබඳ සළකා බලනු ලැබේ.

III. යම් සේවා ස්ථානයකට අයදුම්කරුවන් වැඩි ප්‍රමාණයක් ඉල්ලා සිටින අවස්ථාවකදී ඔහුගේ පෙර සේවා ස්ථාන සහ සේවා කාලය සැළකිල්ලට ගෙන ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

IV. නව පත්වීම්ලාභීන් තමන් අනුයුක්ත කළ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03 ක සේවා කාලයක් අඛණ්ඩව සේවය කළ යුතුය. එහෙත් වැඩි වසර ගණනක් එකම ස්ථානයේ සේවය කරන නව පත්වීම් ලාභියකුගේ සේවා ස්ථානයක් ඉල්ලා සිටින්නේ නම්, ඔහු/ඇය සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

V. සුහද ස්ථාන මාරුවීම් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමේ දී ඒ පිළිබඳව සළකා බැලිය හැක්කේ රාජකාරී හා සේවයේ අවශ්‍යතාවන්ට යටත්වය. එහෙත් නියමිත සේවා කාලය සම්පූර්ණ කර ස්ථාන මාරුවීම් ලැබුවෙක් සුහද ස්ථාන මාරුවීම් යටතේ එම සේවා ස්ථානය නැවත ඉල්ලා සිටියහොත් ඒ පිළිබඳව සළකා බලනු නොලැබේ.

VI. වයස අවුරුදු 55 ඉක්ම වූ නිලධාරීන් අභ්‍යන්තර ස්ථාන මාරු කිරීමේ දී ඔවුන් විසින් ඉල්ලා සිටින සේවා ස්ථානය ලබා දීම කෙරෙහි විශේෂ සැළකිල්ලක් දැක්විය යුතුය.

VII. අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග පිළිබඳව විවිධ බලපෑම් කරන අයට එරෙහිව ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ විධි විධාන ප්‍රකාරව විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

VIII. සේවා අවශ්‍යතා මත යම් දිස්ත්‍රික්කයක් තුළ අභ්‍යන්තර ස්ථාන මාරු කිරීමක් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් අධ්‍යක්ෂ, ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ එකඟතාවය ලබා ගෙන එය සිදු කළ හැක.

IX. අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් සඳහා අවම වශයෙන් එක් සේවා ස්ථානයක වසර 03ක් පමණ සේවය කළ යුතුය.

X. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සේවය කරන නිලධාරීන් තම අයදුම් පත්‍ර ප්‍රාදේශීය ලේකම්ගේ හා දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක සේවය කරන නිලධාරීන් දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව අයදුම්පත්‍ර ඉදිරිපත් කල යුතුය.

XI. ප්‍රධාන කාර්යාල නිලධාරීන් අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

03. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් මණ්ඩලයේ සංයුතිය.

I. අතිරේක ලේකම් ( සංවර්ධන), ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සභාපති

II. අධ්‍යක්ෂ, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ - සාමාජික

III. නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ - සාමාජික

04. අභියාචනා සළකා බැලීම.

සියලු අභියාචනා පිළිබඳ සළකා බැලීම් අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

05. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් ඉල්ලුම් කිරීම සහ නියෝග නිකුත් කිරීම.

I. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුකිරීම් ඉල්ලුම් කිරීම සඳහා සෑම වර්ෂයකම සැප්තැම්බර් 31 දිනට පෙර මේ සමග අමුණා ඇති ඇමුණුම් 2 ආකෘතියට අනුව ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

II. සෑම වර්ෂයකම නොවැම්බර් 31 දිනට පෙර අදාළ අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් පිළිබඳ නිලධාරීන්ට දැනුම් දිය යුතුය.

III. කිසියම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇතත් අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා ඉල්ලුම් නොකරන්නේ නම් තම අභිමතය පරිදි ඔවුන් පිළිබඳ තීරණ ගැනීමේ බලය අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් මණ්ඩලය සතුය.

06. අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් සඳහා ගමන් වියදම් සහ උපදේශන දීමනා ගෙවීම.

අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් සඳහා ගමන් වියදම් ගෙවනු ලබන්නේ පූර්ව සේවා ස්ථානයේ සේවා කාලය සම්පූර්ණ කර තම රාජකාරි නිසි පරිදි තම අනුප්‍රාප්තිකයාට බාර දීමෙන් අනතුරුව නව සේවා ස්ථානය වෙත නියමිත දිනට රාජකාරි සඳහා වාර්තා කර ඇති නිලධාරීන්ට පමණි.

.................................................................

කේ. ප්‍රසන්න චන්දිත්
අධ්‍යක්ෂ
ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය